**24-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, අවිනාශි ඥානයේ මිණිමුතු දානය කිරීම තමයි ලොකුම දානය. ඔබට අධිරාජ්‍යයක් හිමි වන්නේ මෙම දානයෙන් පමණයි. එමනිසා, මහා දානපතියෙක් බවට පත් වන්න.

**ප්‍රශ්නය:** සේවය කිරීමට මහත් ආශාවෙන් සිටින දරුවන්ගේ ප්‍රධානම ගති ලක්ෂණ මොනවා ද?

**පිළිතුර:** 1). ඔවුන් පැරණි ලෝකයේ වාතාවරණයට කිසිසේත්ම කැමති නැහැ. 2). බොහෝ දෙනෙකකුට සේවය කිරීමට ඔවුන් ඉතාමත් ආසාවක් දක්වනා අතර අන් අයවත් තමා හා සම අය බවට පත් කරවාලයි. 3). ඔවුනට සුවයක් දැනෙන්නේ ඉගෙන ගැනීමෙනුත් අන් අයට ඉගැන්වීමෙනුත් පමණයි. 4). අන් අයට උගන්වනා අතර ඔවුන්ගේ උගුර වේලී ගියත්, ඔවුන් සිටින්නේ සතුටිනුයි. 5). ඔවුනට කාගේවත් බුදලයක් අවශ්‍ය වන්නේ නැත. කාගේ හෝ දේපළක් පසුපස හඹා යමින් ඔවුන් කවදාවත් තම කාලය අපතේ යවන්නේ නැහැ. 6). ඔවුන්ගේ බන්ධන් රුහැන් සෑම පැත්තකින්ම බිඳී ගිගින්ය. 7). ඔවුන් බාබා සේම ත්‍යාගශීලි දරුවන්ය. සේවය කරනවා හැරෙන්න ඔවුන්ට වෙන කිසිම දෙයක් මිහිරි දෙයක් වන්නේ නැත.

**ගීතය:** ඕම් නමෝ ශිවාය!

ඕම් ශාන්ති. ඔබට දැන් මොහොතකට පෙර ඇසුණු ගුණ ගායනා කළ ආධ්‍යාත්මික පරම පියා මෙහි සිට දරුවන් වන ඔබලාට උගන්වනවා. මෙය පාසලක්. ඔබ සෑම කෙනෙක්ම ගුරුවරයාගෙන් ඉගෙන ගන්නවා. උත්තරීතර පරම පියා, පියා කියාත් හඳුන්වන මොහු උත්තරීතර ගුරුවරයායි. උත්තරීතර පියා කියා හැඳින්විය හැක්කේ ආධ්‍යාත්මික පරම පියාට පමණයි. භෞතික පියෙකුට කවදාවත් උත්තරීතර පියා කියා කියන්න බැහැ. ඔබ කියාවී: අපි දැන් අසුන් ගෙන සිටින්නේ පාරලෞකික පියා සමඟයි. ඇතැම් අය මෙහිම අසුන්ගෙන සිටිනා අතර තවත් අය අමුත්තන් වශයෙන් ඇවිත් යනවා. තමන්ගේ උරුමය දිනා ගැනීම සඳහා ඔබ දැන් අසීමිත පරම පියා සමඟ අසුන් ගෙන සිටිනා බව ඔබට තේරෙනවා. ඉතින් එමනිසා ඔබ තුළ දැන් විශාල අභ්‍යන්තරික සතුටක් තිබිය යුතුයි. දුප්පත් මිනිසුන් වේදනාවෙන් අඬමින් සිටිනවා. මේ කාලයේ ලෝකයේ සිටිනා සෑම කෙනෙක්ම කියන්නේ ලෝකයට සාමය අවශ්‍යයි කියලයි. සාමය කියන්නේ කුමක්ද කියලා දුප්පත් අහිංසක මිනිසුන් දන්නේ නැහැ. ඥානයේ සාගරය, සාමයේ සාගරය වන පරම පියා පමණයි සාමය ස්ථාපනය කරන්නේ. අශාරීරික ලෝකයේ ඇත්තේ සාමයම පමණයි. මෙහි මිනිස්සු වේදනාවෙන් කෑගසනවා: ලෝකයේ සාමය බිහි වන්නේ කෙසේ ද? එකම එක ධර්මයක් පමණක් තිබුණු කල නව ලෝකයේ ස්වර්ණමය යුගයේ තිබුණේ සාමයම පමණයි. නව ලෝකය හඳුන්වන්නේ පාරාදීසය එනම් දේවතාවරුන්ගේ ලෝකය යන නමිනි. ග්‍රන්ථ වල සෑම තැනකම ලියා ඇත්තේ නොසන්සුන් දේවල්ම පමණයි. තඹ යුගයේ කාන්ස්වරුන් පෙන්වා ඇති අතර ස්වර්ණමය යුගයේ හිරණකාශ්‍යපව පෙන්වා තිබෙනවා. රිදී යුගයේ රාවණ්ගේ කලබලකාරීත්වයත් පෙන්වා තිබෙනවා: සෑම තැනකම පෙන්වා ඇත්තේ නොසන්සුන්තාවයයි. දුප්පත් මිනිස්සු ඉන්නේ එතරම්ම ඝන අන්ධකාරයකයි. මිනිස්සු අසීමිත පියාට කන්නලව්කරනවා. පරම පියා වන උත්තරීතර දෙවියන් පැමිණි විට පමණයි ඔහු සාමය ස්ථාපනය කරන්නේ. දුප්පත් මිනිසුන් දෙවියන්ව හඳුනන්නේ නැහැ. සාමය ඇත්තේ නව ලෝකයේ පමණයි. පැරණි ලෝකයේ එය තිබෙන්නට බැහැ. නව ලෝකය ස්ථාපනය කරන්නේ පරමාත්ම පියා පමණයි. මිනිස්සු ඔහුට පැමිණ සාමය ස්ථාපනය කරන්න කියා ඉල්ලමින් කන්නලව් කරනවා. ආර්ය සමාජයට අයිති අය පවා සාමය දානය කරන්නාගේ ගුණ ගායනා කරනවා. පියා කියනවා: පළමුව පාරිශුද්ධත්වයයි. ඔබලා දැන් පාරිශුද්ධත්වයට පත් වෙමින් සිටියි. එහි පාරිශුද්ධත්වය, සාමය, සුවය, ධනය හා සියල්ලම තිබෙනවා. මිනිස්සු ධනයෙන් තොරව දුකට පත් වෙලා. ඔබ මෙහි පැමිණෙන්නේ ලක්ෂ්මි හා නාරයන් සේ ධනවත් වීමටයි. ඔවුන් ලෝක පාලකවරුන් වශයෙන් සිටියා. ඔබ මෙහි පැමිණ සිටින්නේ ලෝක පාලකවරුන් බවට පත් වීමටයි. කොහොමනමුත්, එකිනෙකාගේ බුද්ධිය ඇත්තේ එක් එක් ප්‍රමාණයටයි. බාබා කියා තිබෙනවා: උදේ පාන්දරම පෝළිමට පාරේ ඇවිදගෙන යනවා නම් අනිවාර්යයෙන්ම ලක්ෂ්මි හා නාරායන්ගේ පින්තූරය අරගෙන යා යුතුයි. එවන් ක්‍රම සොයා ගන්න. දරුවන්ගේ බුද්ධිය දැන් දිව්‍යමය වෙමින් තිබෙනවා. මේ කාලය වන විට තමෝප්‍රධාන් තත්ත්වයෙන් එය රජෝ

තත්ත්වයට පත්වී තිබෙනවා. සතෝ වීමෙන් පසුව දැන් සතෝප්‍රධාන් විය යුතුයි. ඒ ශක්තිය ඔබට තවමත් නැහැ. ඔබ බාබා සිහි කරන්නේ නැහැ. යෝගා බලය සෑහෙන්න අඩුයි. කිසිම කෙනෙකුට එක් ක්ෂණයකින් සතෝප්‍රධාන් වෙන්න බැහැ. එක් තත්පරයකින් ලබනා ජීවන මුක්තිය ගැන සඳහන් කර තිබෙනවා. ඒක හොඳයි. ඔබලා බ්‍රහ්මීණ්වරුන් වී සිටිනා නිසා ජීවන මුක්තිය ලබලයි සිටින්නේ. ජීවන මුක්තියේ දී පවා ඉහළම ඉහළ, මධ්‍යම හා පහළ තත්ත්වයන් තිබෙනවා. පරම පියාට අයිති අය අනිවාර්යයෙන්ම ජීවන මුක්තිය ලබනවා. ඇතැම් අය පරම පියාට අයිති වී පසුව ඔහුව හැර ගියත්, ඔවුන්ට ජීවන මුක්තිය හිමි වෙනවා. ඔවුන් දිව්‍ය ලෝකයේ බිම අතු ගාන්නන් බවට පත් වේවී. අවම වශයෙන් ඔවුන් දිව්‍ය ලෝකයට යාවී. නමුත් ලබනා තත්ත්වය ඉතාමත් පහළ තත්ත්වයක් වේවී. පරම පියා ඔබට කවදාත් විනාශ නොවන අවිනාශි ඥානයක් දෙනවා. දරුවන් වන ඔබගේ හදවත් තුළ සතුටේ බෙර වාදනය විය යුතුය. වේදනාවෙන් හඬන හැඬීම අවසන් වන විට විශ්මයේ හඬ අවදි වේවී. ඔබලා දැන් දෙවියන්ගේ දරුවනුයි. පසුව ඔබලා දේවතාවන්ගේ දරුවන් බවට පත් වෙනවා. මේ කාලයේ දී ඔබලාගේ ජීවිතය දියමන්තියක් සේ වටිනවා. ඔබ භාරතයට සේවය කරමින් එය සාමකාමී කරනවා. එහි පාරිශුද්ධත්වය, සාමය හා සතුට තිබෙනවා: එහි සියල්ලම තිබෙනවා. ඔබගේ මෙම ජීවිතය දේවතාවරුන්ගේ ජීවිතයටත් වඩා වටිනවා. ඔබලා දැන් නිර්මාපකයා වන පරම පියාවත් ලෝක චක්‍රයත් ගැන දන්නවා. සෑම උත්සවයක්ම කාලයත් සමඟම දිගටම පැවතෙනවා කියා සඳහන් වෙනවා. කොහොමනමුත්, එය කවදා පටන් ද? කිසිම කෙනෙක් මෙය දන්නේ නැහැ. ලෝකය ආරම්බ වුණු දවසේ පටන් රාවණ් පිළිස්සීමත් අසංක කාලයක සිට පවතිනවා. කොහොමනමුත්, සත් යුගයේ රාවණ් ඇත්තේ නැහැ. එහි කිසිම ආකාරයක දුකක් නැති නිසා ඔවුන් දෙවියන්ව සිහිපත් කරන්නෙත් නැහැ. මෙහි සෑම කෙනෙක්ම දිගටම දෙවියන්ව සිහිපත් කරනවා. ලෝකයට සාමය ගෙන එන්නේ දෙවියන් පමණයි කියා ඔවුන් විශ්වාස කරනවා. මෙන්න මේ නිසා තමයි ඔවුන් කියන්නේ: පැමිණ අප කෙරෙහි අනුකම්පා දක්වන්න. පැමිණ අපව දුකින් ගලවා ගන්න. පරම පියාට කතා කරන්නේ දරුවනුයි. මන්ද සතුට දැක තිබෙන්නේ දරුවනුයි. පරම පියා කියනවා: මම ඔබව පාරිශුද්ධත්වයට පත් කරවා ආපසු ඔබව සුමිහිරි නිවහන වෙත ගෙන යන්නම්. පාරිශුද්ධත්වයට පත් නොවනා අයට දඬුවම් විදීමට සිදුවේවී. මෙහිදී ඔබලා තම සිතුවිලි වචන හා ක්‍රියා තුළින් පාරිශුද්ධව සිටිය යුතුයි. ඔබගේ සිතුවිලි ඉතාමත් හොඳ විය යුතුයි. අවසානයේ එකදු නිෂ්ඵල සිතුවිල්ලක්වත් ඇති නොවන ආකාරයේ උත්සාහයක් ඔබ විසින් දැරිය යුතුයි. එකම එක පරම පියා හැරෙන්න වෙන කිසිදු කෙනෙක්ව ඔබ සිහිපත් නොකළ යුතුයි. පරමාත්ම පියා පැහැදිලි කර කියා දෙනවා: කර්මාතීට් තත්ත්වයට පත් වන තෙක් මෙවන් සිතුවිලි නැවත නැවතත් හට ගනීවී. හනුමාන් සේ ස්ථාවර කෙනෙක් බවට පත් වන්න. එයට ලොකු උත්සාහයක් අවශ්‍යයි. කීකරු විශ්වාසවන්ත හා යෝග්‍ය දරුවන් බාප්දාදාගේ ආදරයට ලක් වෙනවා. පස් පව් ජය නොගත් අයට එතරම් ආදරණීය අය බවට පත් වෙන්න බැහැ. තමන් සෑම කල්පයකම පරම පියාගෙන් උරුමය දිනා ගන්නා බව ඔබ දන්නා නිසා සතුටේ රසදිය කඳ ඉතාමත් ඉහළින් ඉහළ යා යුතුයි. ස්ථාපනය අනිවාර්යයෙන්ම සිදු වීමට යන බව ඔබත් දන්නවා. මෙම පැරණි ලෝකය අනිවාර්යයෙන්ම සොහොනක් බවට පත් විය යුතුයි. සුර දේවතාවරුන්ගේ දේශය වෙත යාමට මීට පෙර කල්පයේ දී කළ ආකාරයෙන්ම අප දිගටම උත්සාහ දරමින් සිටිනවා. මෙය සොහොනක්. පැරණි ලෝකය හා අලුත් ලෝකය යන්න පිළිබඳව පැහැදිලි කිරීමක් ඉණිමඟ පින්තූරයේ පෙන්වා තිබෙනවා. ඉණිමඟ පින්තූරය ඉතාමත් හොඳයි. නමුත් මිනිස්සුන්ට ඉන් කිසිම දෙයක් තේරුම් ගන්න බැහැ. සාගරයේ වෙරළ මත මෙහි සිටිනා අයටත් සම්පූර්ණයෙන්ම තේරුම් ගැනීමට බැරිවයි සිටින්නේ. ඔබ අනිවාර්යයෙන්ම ඥානයේ ධනය දානය කළ යුතුයි. ඥානයේ ධනය දානය කිරීමෙන් එය කවදාවත්ම අවසන්ව යන්නේ නැහැ. දානපති මහා දානපති කියා කියනවා. රෝහලක් හෝ ධර්ම ශාලාවක් ගොඩනැඟූ කෙනෙක්ට මහා දානපතියෙක් කියා කියනවා. එම ක්‍රියාවේ ඵලය ඊළඟ උපතේ දී තාවකාලික කාලයකට ඔවුනට ලැබෙනු ඇත. උදාහරණයක් වශයෙන් කියනවා නම් කෙනෙක් ධර්ම ශාලාවක් හැදුවොත් ඊළඟ උපතේ දී ඔවුනට යහපත් නිවසක සතුට හිමි වනු ඇත. ලොකු ධනයක් දානය කරනා රජ කෙනෙකුට දාව හෝ ධනවත් පුද්ගලයෙකුට දාව උපත ලබනු ඇත. දානය කිරීමෙන් ඔවුන් ඒ තත්ත්වයට පත් වනු ඇත. නමුත් ඔබ ඉගෙන ගැනීමෙන් රාජකීය තත්ත්වයක් දිනා ගනු ඇත. ඉගෙන ගැනීමත් දානය කිරීමත් දෙකම තිබෙනවා. මෙහි මෙය සෘජු දෙයක් වන අතර භක්ති මාර්ගයේ දී එය වක්‍රව සිදු වෙනවා. ශිව බාබා ඥානය තුළින් ඔබලාව ඒ තත්ත්වයට පත් කරවනවා. අවිනාශී ඥානයේ මිණිමුතු ඇත්තේ පරමාත්ම පියා ළඟ පමණයි. සෑම මැණිකක්ම රුපියල් සිය දහස් ගණනක් වටිනවා. භක්ති මාර්ගයේ දී මෙවන් දෙයක් කියන්න බැහැ. මෙය හඳුන්වන්නේ ඥානය කියායි. ග්‍රන්ථ වල ඇත්තේ භක්තියේ දැනුමයි: භක්ති කරන්නේ කෙසේ ද කියා ඉන් කියා දෙනවා. හිස මුදුනටම නගිනා ඥානයේ කූල්මත් බවක් දරුවන් වන ඔබට තිබෙනවා. ඔබ ඥානය ලබන්නේ භක්තියෙන් අනතුරුවයි. ඥානය තුළින් ඔබට

ලෝක ආධිපත්‍යයේ කූල්මත් බව හිස සිට පතුලටම අත් දකිනවා. හොඳ දේශනා දෙන අයව කෞතුකාගාර හා ප්‍රදර්ශනාගාර වලට ආරාධනා කරනවා. එහිදීත් සියලු දෙනාම ඉන්නේ එක් එක් පිළිවෙළටයි. ඇතුන් පිට යන්නන්, අශ්වයන් පිට යන්නන් හා පාබල සොල්දාදුවන් සිටිනවා. දිල්වාලා දේවාලයේ එම සිහිවටනය නිර්මාණය කර තිබෙනවා. ඔබ කියනවා: මෙය ජීවමාන දිල්වාලයි. එය අජීවී එකයි. ඔබලා අදෘශ්‍යමාන වන නිසා මිනිස්සු ඔබලාව හඳුනන්නේ නැහැ. ඔබලා රාජ රීෂින්ය. ඔවුන් හත යෝගා රීෂීන්ය. දැන් ඔබලා ගයාන් ගයානේෂ්වරුන් (ඥානයෙන් පිරි) වෙනවා. ඥානයේ සාගරය ඔබලාට ඥානය දෙනවා. ඔබලා සදාකාලික ශල්‍ය වෛද්‍යවරයාගේ දරුවනුයි. ඔබගේ හද ගැස්ම දැන ගන්නේ ඒ ශල්‍ය වෛද්‍යවරයායි. තමන්ගේම හද ගැස්ම ගැන දන්නේනැති අය අනිත් අයගේ හද ගැස්ම ගැන දැන ගන්නේ කෙසේ ද? ඔබලා සදාතනික වූ ශල්‍ය වෛද්‍යවරයාගේ දරුවනුයි නේද? සත්ගුරු ඔබට ඥානයේ තෙල ලබා දෙනවා. මෙය ඥානයේ ජීවයට එන්නතක් දෙනවා. ඒ ප්‍රශංසාව මේ කාලයට අයිති එකක්. එය සත්ගුරුගේ ගුණ ගායනාවයි. ගුරුන්ට ඥානයේ එන්නත දෙන්නේ සත්ගුරු පමණයි. ඔබලා සදාකාලික වූ ශල්‍ය වෛද්‍යවරයාගේ දරුවනුයි. ඉතින් ඔබගේ කාර්යය සෑම කෙනෙකුටම ඥානයේ එන්නත ලබා දීමයි. වෛද්‍යවරුන් අතරිනුත් ඇතැම් අය මසකට රුපියල් සිය දහස් ගණනක් උපයනා අතර අනිත් අය රුපියල් පන්සියයක් උපයා ගන්නේ අමාරුවෙන්. මිනිස්සු එක් එක්කෙනා ළඟට යන්නේ අනුපිළිවලිනුයි. ඉහළ උසාවියෙන් හෝ උත්තරීතර උසාවියෙන් කෙනෙක්ව එල්ලුම් ගස් යවන්න කියා තීන්දුවක් නියම කෙරෙනවා. පසුව ජනාධිපතිට අභියාචනාවක් ඉදිරිපත් කළ විට ඔහු ඔහුට සමාව දෙනවා. දරුවන් වන ඔබලා කූල්මත් බවින් පිරි ත්‍යාගශීලී හදවතක් ඇතිව සිටිය යුතුයි. පරමාත්ම පියා මෙම වාසනාවන්ත රථයට ඇතුළු වුණු නිසා මොහු ත්‍යාගශීලී හදවතක් ඇත්තෙක් බවට පත් කෙරෙව්වා. ඔහුට ඕනෑම දෙයක් කළ හැකියි. නැද්ද? පරම පියා මොහුට ඇතුළු වීපාලකයා වුණා. හොඳයි, ඒ සියල්ලම භාරතයට යහපත සැලසීම සඳහා යෙදවිය යුතුයි. ඔබ භාරතයේ යහපත සඳහා ඔබගේ ධනය යොදවනවා. ඔබගේ වියදම් දරන්නේ කෙසේද කියා කවුරු හෝ ඔබගෙන් ඇසුවහොත් කියන්න: අපි අපේම ශරීරයෙන්, මනසින් හා ධනයෙන් තමයි මෙම සේවය කරන්නේ කියලා. අපි පාලනය කිරීමට සිටිනා නිසා අපේම මුදල් පාවිච්චි කරනවා. අපිම අපේ වියදම් දරා ගන්නවා. බ්‍රහමීණ්වරුන් වන අප ශ්‍රීමත් අනුගමනය කර අධිරාජ්‍ය ස්ථාපනය කර ගන්නවා. බ්‍රහමීණ්වරුන් වුණු අය වියදම් දරා ගනීවී. ශුද්‍රයින්ගෙන් අප බ්‍රහමීණ් වරුන් වී සිටිනා අතර පසුව අප දේවතාවරුන් විය යුතුයි. බාබා කියනවා සෑම පින්තූරයක්ම ට්‍රාන්ස්-ලයිට් (විනිවිද පෙනෙන) ස්වරූපයට හදන්න. එවිට මිනිස්සු ඉක්මනින් එයට ආකර්ෂණය වී ඊතලය ඉතාමත් හොඳින් ඉලක්කය කරා යාවි. ඇතැම් අය විජ්ජාවන්ට බය නිසා කවදාවත් මෙහි එන එකක් නැහැ. සාමාන්‍ය මනුෂ්‍යයෙක් දේවතාවරයෙක් බවට පත් කරවනවා යන්න විජ්ජාවක් නොවෙයි ද? දෙවියන් කියනවා: මම ඔබට රාජයෝගාව උගන්වනවා. හතා යෝගීන්ට කවදාවත් රාජ යෝගාව උගන්වන්න බැහැ. ඔබට දැන් මේ දේවල් තේරෙනවා. ඔබලා දේවාලයක අසුන් ගැනීමට සුදුසු අය බවට පත් වෙනවා. මේ කාලයේදී මුළු ලෝකයම අසීමිත ලංකාවක්. මුළු ලෝකය පුරාම පැතිරී ඇත්තේ රාවණ්ගේ රාජ්‍යයයි. සත් යුගයේ හා රිදී යුගයේ රාවණ් ඉන්නේ කෙසේ ද? පරම පියා කියනවා: දැන් මම ඔබට කියනා දෙය අහන්න. මේ ඇස් වලින් කිසිම දෙයක් දකින්න එපා. මෙම පැරණි ලෝකය විනාශ විය යුතුයි. මෙන්න මේ නිසා තමයි අපි සාමයේ දේශයත් සතුටේ දේශයත් සිහිපත් කරන්නේ. වන්දනාකරුවන්ගේ තත්ත්වයෙන් ඔබ දැන් වන්දනීය තත්ත්වයට පත් වෙනවා. මොහු අංක එකේ වන්දනාකරුවෙක් ලෙස සිටියා. ඔහු සෑහෙන්න නාරායන්ව වන්දනා කරමින් සිටියා. දැන් ඔහු නැවතත් වතාවක් වන්දනීය නාරායන් බවට පත් වෙමින් සිටිනවා. ඔබටත් උත්සාහ දරා ඒ තත්ත්වයට පත් විය හැකියි. පළමුවන එඩ්වඩ් දෙවන එඩ්වඩ් කියා සිටියා සේ අධිරාජ්‍යය ඉදිරියටම යාවී. පරම පියා කියනවා: ඔබලා මට සර්ව ව්‍යාප්තියි කියා කියමින් මාව ප්‍රතික්ෂේප කරමින් සිටියා. ඒ වුණත් මම ඔබව නගා සිටුවා මෙම නාටකය ඉතාමත් ලස්සනට නිර්මාණය කර තිබෙනවා. ඔබ අනිවාර්යයෙන්ම උත්සාහ දැරිය යුතුයි. නාටකයට අනුව මීට පෙර කල්පයේ දී ඔබ දැරූ උත්සාහයම නැවතත් දරණු ඇත. සේවය කිරීමේ මහත් ආශාවෙන් සිටිනා දරුවන් තුළ පමණයි මෙම සැලකිල්ල දිවා රෑ පුරාම තිබෙන්නේ. දරුවන් වන ඔබලා දැන් පරම පියා හරහා පාර සොයා ගෙන සිටිනා නිසා අන් අයට සේවය කිරීමට හැරෙන්න වෙන කිසිම දෙයක් කිරිමට ඔබ කැමති නැහැ. ලෞකික වාතාවරණයටඔබ කැමති නැහැ. සේවය කරනා අය සේවය කිරීමෙන් තොරව කිසිම සුවයක් අත්දකින්නේ නැහැ. ගුරුවරයෙක් ඉගැන්වීමෙන් සතුට ලබනවා. ඔබලා දැන් ඉතාමත් උසස් ගුරුවරුන් බවට පත් වෙනවා. ඔබගේ රාජකාර්යය මෙයයි. ගුරුවරයෙක් හොඳ වුණු තරමට ඔහු බොහෝ අයව තමා හා සම අය බවට පත් කරවනවා. ඒ නිසා ඔහුට ඒ වෙනුවෙන් ත්‍යාගයක් හිමි වෙනවා. කිසියම් කෙනෙකුට ඉගැන්වීමෙන් තොරව ඔහුට කිසිම සතුටක් ලැබෙන්නේ නැහැ. ප්‍රදර්ශන වලදී ඇතැම් විට, මහා රෑ 12 ට වුණත් ඔවුන් සතුටින් සිටිනවා. වෙහෙසට පත් වී

උගුර වේලි ගියත් ඔවුන් සතුටින් සිටිනවා. මන්ද මෙය දේවමය සේවයයි. මෙය ඉතාමත් උසස්ම උසස් සේවයකි. ඔවුන්ට වෙන කිසිම දෙයක් මිහිරි දෙයක් වශයෙන් දැනෙන්නේ නැහැ. ඔවුන් කියනවා: මේ දේපළ ළඟ තියාගෙන මොනවා කරන්න ද? අපිට අවශ්‍ය උගන්වන්නයි. අපට කරන්න අවශ්‍ය එකම එක සේවය මෙයයි. තම ධනය හෝ දේපළ වල කිසියම් අර්බුදකාරි තත්ත්වයක් තිබෙනවා කියා දැක්කොත්, ඔවුන් කියනවා: ඔබගේ කන් කපා ගෙන යන මේ රත්රන් තියා ගෙන ඉදලා ඇති වැඩේ මොකක් ද? සේවය කිරීමෙන් ඔබගේ බෝට්ටුව එතෙර විය යුතුයි. බාබා කියනවා: ගොඩනැගිලි දානය කරන්නන්ට ඒවා තම නමින්ම තබා ගෙන සිටිය හැකියි. බී. කේ. වරුන්ට අවශ්‍ය කරන්නේ සේවය කිරීමට පමණයි. කුමන හෝ ආකාරයක බාහිර බන්ධනයක් මෙම සේවයට එතරම් හොඳ නැහැ. ඇතැම් අයගේ බන්ධන රැහැන් ඔවුන්ව තවමත් අදිනා අතර අනිත් අයගේ රැහැන් කැඩිලා. බාබා කියනවා: 'මන්මනාභව' වන්න ඔබගේ පව් විනාශ වී යාවී. ඔබට ලොකු උදව් ලැබේවී. ඔබ සේවයේ නිරතව සිටිය යුතුයි. මෙම සේවයෙන් ලොකු ආදායම් ලැබෙනවා. මෙය ගොඩනැගිලි ආදිය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. කෙනෙක් ගොඩනැගිල්ලක් දී කොන්දේසි ගැනත් කතා කරනවා නම් ඒ ගොඩනැගිල්ල ගන්න එපා. සේවය කිරීමට දන්නේ නැති අයගෙන් අපට ඇති ප්‍රයෝජනයක් නැහැ. ගුරුවරයෙක් අන් අයව තමා හා සම කෙනෙක් බවට පත් කරවනවා. ඔවුන් මේ තත්ත්වයට පත් වුණ් නැතිනම් ඇති ප්‍රයෝජනය කුමක් ද? උදව්කරුවන් රාශියකගේ ලොකු අවශ්‍යතාවයක් තිබෙනවා. එයිනුත් මව්වරුන් හා කුමාරීන් වඩාත්ම වැදගත්. පරමාත්ම පියා ගුරුවරයා වන නිසා දරුවන් වන ඔබලාත් ගුරුවරුන් විය යුතුයි යන්න දරුවන්ට තේරෙනවා. ගුරුවරුන්ට වෙන කිසිම ක්‍රියාවක් කරන්න බැහැයි කියා කිසිම දෙයක් නැහැ. සෑම ආකාරයක ක්‍රියාවක්ම ඔවුන් කළ යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. දිවා රෑ සේවය ගැන වූ සිතුවිලිම පමණක් තබා ගන්න. අනිකුත් සියලුම බන්ධන රැහැන් කඩා දමන්න. සේවය කිරීමෙන් තොරව කිසිම සැපක් නැහැ. සේවය කර අන් අයවත් තමා හා සම කෙනෙක් බවට පත් කරවා ගන්න.
2. පියා සේම ත්‍යාගශීලි හදවතක් ඇත්තෙක් බවට පත් වන්න. සෑම කෙනෙකුගේම හද ගැස්ම හඳුනා ගනිමින් ඔවුනට සේවය කරන්න. භාරතයට සේවය කිරීම සඳහා ඔබගේ ශරීරය, මනස හා ධනය යොදවන්න. ස්ථාවර සහ නිශ්චල කෙනෙක් බවට පත් වීමට නම් කීකරු හා ශ්‍රද්ධාවන්ත වන්න.

**වරදානය:** ඔබ "ඇයි?" සහ "කුමක්ද?" වැනි ඕනෑම ප්‍රශ්න ජාලයෙන් නිදහස්ව සිටින ලෝක සේවාධාරියෙකු වී, ලෝක පාලකයෙකු බවට පත් වේවා.

ඔබේ ස්ව දර්ශන චක්‍රය නිවැරදි ක්‍රමයට භ්‍රමණය වනවා වෙනුවට වැරදි ක්‍රමයට භ්‍රමණය වන විට, ඔබ මායා ජයගන්නෙකු වීම වෙනුවට, අන් අය දෙස බැලීමේ ව්‍යාකූලත්වයේ භ්‍රමණයට හසු වේ. මේ නිසා, "ඇයි?" සහ "කුමක්ද?" වැනි ප්‍රශ්න ජාලයක් නිර්මාණය වේ. ඔබම එය නිර්මාණය කර පසුව ඔබම එහි සිරවී සිටී. එබැවින්, දැනුමෙන් පිරිපුන් වී නිවැරදි ක්‍රමයට ස්ව දර්ශන චක්‍රය දිගටම කරකවන්න, එවිට ඔබ "ඇයි?" සහ "කුමක්ද?" වැනි ප්‍රශ්න ජාලයෙන් නිදහස් වනු ඇත. ඔබ යෝග්‍යුක්ත, ජීවනමුක්ත සහ ලෝක පාලකයෙකු බවට පත් වනු ඇත. ලොවට යහපත සැලසීමේ සේවය කරමින් ඔබ පියා සමඟ දිගටම වටේට සංචාරය කරනු ඇත. ලෝක සේවාධාරියෙකු වීමෙන්, ඔබ ලෝකය පාලනය කරන රජෙකු වනු ඇත.

**පාඨය:** **අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මාතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

***** ඕම් ශාන්ති *****

ඔබ ඔබේ කර්මාතීත් අවධියට සමීප වූ විට, ඔබේ බුද්ධිය කිසිදු ජීවාත්මයකට යටත් නොවනු ඇති අතර ඔබ කිසිදු කර්ම බන්ධනයක් නිර්මාණය නොකරනු ඇත. මෙයින් අදහස් කරන්නේ ඔබ සියලු කර්ම බන්ධන වලින් නිදහස් වන බවත්, පදාර්ථය හරහා ක්‍රියා කිරීමට හැකි වන උපකරණයක් ලෙස වෙන්ව සිටින බවත්ය.

කර්මතීත් අවධිය අත්විඳීමට, ඔබට නැවත නැවතත් නොබැඳි වීමේ උත්සාහය දැරීමට සිදු නොවේ. පහසුවෙන් සහ ස්වභාවිකව අත්විඳින්න: සියල්ල කරන භෞතික ඉන්ද්‍රියන් එය කරවන ජීවාත්මයෙන් වෙන්ව පවතී.